# 10 නරියාගේ වලිගය සුදුපාට වුණු හැටි

නරියා දුඹුරු පාට සතෙක්. ඒ වුණාට උගේ වලිගය සුදු පාටයි. එහෙම වුණේ කොහොමද කියල දැනගන්න ඔයාලා ආස ඇති නේ ද?

එක රටක ආච්චි කෙනෙක් හිටිය. ඒ ආච්චි ඌරන් හා කිකිළියන් ඇති කළා. මෙයා වයස වැඩි නිසා හිතුව මේ සතුන් බලා ගන්න කාට හරි බාර දෙන්න ඕන කියල.

ඒ ආච්චි එක මිනිහෙකු ළඟට ගිහින් කිව්වා, මට මේ සතුන් ටික බලලා දෙන්න කියල. එයාට වැඩ තියනව කියල කැමති වුණේ නෑ.

ඊට පස්සෙ ඒ ආච්චි, සතෙකුටවත් මේ වැඩේ බාර දෙනව කියල වලහෙකු හොයාගෙන ගියා. වලහත් ඌරන්, කුකුළන් කැමට ගන්න කෙනෙක්. ඌත් බොහොම ආසාවෙන් ඒ වැඩේ බාර ගත්ත. ඒත් එයාගෙ "ගර්ර්ර්....." සද්දෙ ආච්චිට ඇහුණම ආච්චි හිතුව අනේ මගෙ සත්තු ටික ඒ හඬට බයවෙයි කියල, ආපහු යන්න ගියා.



ඔය විදියට වෘකයා, කොටිය වගේ කිහිප දෙනකු ළඟට ම ආච්චි ගියත් හරි ගියෙ නැහැ. අන්තිමට ගියෙ නරියා ළඟට. නරියා බොහොම කපටි සතෙක් නෙ. ඌ කිව්ව මම ඒ සත්තුන්ට "මගෙ පුංචි දරුවනේ" කියල කතා කරන්නම් කියල. ආච්චි එයාට කැමති වෙලා පැටව් ටික නරියාට බාර දුන්න බලා ගන්න.

ඔහොම යන අතරෙ දවසක් ආච්චි බලනකොට කූඩුවෙ හිටපු කළු ඌරු පැටවෙකුයි කිකිළි පැටවෙකුයි අඩු වෙලා. නරියාගෙන් අහපුවා ම නරිය කිව්ව. ඒ අය ඇවිදින්න ගිහින් දැන් ළඟ එනව ඇති කියල. ඒත් ඒ පැටව් දෙන්නා ආපහු ආවේ නෑ.

තව දවසක් ආච්චි බොන්න උණු කරපු කිරි වීදුරුවත් අතේ තියාගෙන කූඩුව පැත්තට ගියා. යනකොට කිකිළියො ටික "කොක්, කොක්, කොකෝක්...." කියල කෑ ගහනව. කූඩුව ඇතුළෙ ඉගිළෙනවා. උන් හොඳට ම බයවෙලා.



ආච්චි ඉක්මනින් දුවල බලනකොට නරියා කිකිළියකුත් ඩැහැගෙන එළියට බහිනව දැක්ක. ආච්චිට කේන්ති ඇවිත් කිරි කෝප්පෙන් නරියාට දමල ගැහුව. කිරි ටික වැදුණෙ නරියාගෙ වල්ගෙට. නරියා පස්ස නොබලා කැලේට ම දුවගෙන ගියා.

ඌ හැරිලා වලිගෙ දිහා බැලුව. කිරි හැලිල වලිගෙ කෙළවර සුදු වෙලා. එද ඉඳල අදටත් නරිය දුඹුරු පාට වුණත් උගෙ වල්ගෙ සුදු පාටයි.

මොනව හරි කෙනකුට පරිස්සමට දීපුවහම ඒක පරිස්සම් වුණේ නැත්නම් "නරියට කුකුල්ලු බාර දුන්න වගේ" කියල කියමනකුත් අපි අතර තියෙනව.

## ක්‍රියාකාරකම : 1

i. මෙම කතන්දරය නිහඬ ව කියවන්න.

ii. ඔබට නුහුරු යෙදුම්වල අදහස වටහාගෙන ශබ්ද නගා කියවන්න.

iii. අසන්නන්ට අවබෝධ වන ලෙස සුදුසු පරිදි වචන උච්චාරණය කරමින් කියවන්න.

iv. තවත් මිතුරකු/මිතුරියක හා එක් ව ඡේදයෙන් ඡේදය මාරුවෙන් මාරුවට කියවන්න.

v. ඔබට වඩාත් ම රසවත් අවස්ථාව උපුටා කියවන්න.

## ක්‍රියාකාරකම : 2

පාඩම කියවා වඩාත් ගැළපෙන පිළිතුර තෝරා කියන්න.

I. නරියා මොන පාට ද?
  i. සුදු පාටයි
  ii. දුඹුරු පාටයි
  iii. කළු පාටයි

II. ආච්චි ඇති කළ සතුන් වුණේ,
  i. වලසුන් හා කුකුළන්
  ii. ඌරන් හා වලසුන්
  iii. ඌරන් හා කිකිළියන්

III. ආච්චි සතුන් බලාගන්න දෙන්න මුලින් ම ගියේ කා ළඟට ද?
  i. වෘකයා ළඟට
  ii. වලහා ළඟට
  iii. නරියා ළඟට

IV. වලහා කෑ ගැසුවේ මොන හඬින් ද?
  i. ගර්ර්ර්............
  ii. කොක්, කොක්, කොකෝක්
  iii. වව්! වව්! වව්!

V. නරියා සතුන්ට කතා කරනව කීවේ කොහොම ද?
  i. කොක්, කොක් කියල
  ii. මගේ පුංචි දරුවනේ කියල
  iii. ගර්ර්ර්, කියල

## ක්‍රියාකාරකම : 3

අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු කියන්න.

1. ආච්චි දවසක් කුඩුවට යනකොට අඩුවෙලා හිටියේ කුමන සතුන් ද?
2. සතුන් අඩු වීම ගැන නරියා දුන් පිළිතුර කුමක් ද?
3. ආච්චි උණු කිරි කෝප්පය රැගෙන කුඩුව ළඟට යන විට සිදු වූණේ කුමක් ද?



4. රමුනීස 080473

4. කේන්ති ආව ආච්චි කළේ කුමක් ද?
5. නරියගෙ වල්ගය කෙළවර සුදුපාට වුණේ ඇයි?
6. මේ කතාවෙන් ඔබ වටහාගත්තේ කුමක් ද?
7. "නරියාට කුකුල්ලු බාර දුන්නා වගේ " කියල කියන්නේ කුමන අවස්ථාවකදී ද?

## ක්‍රියාකාරකම :4

මෙවැනි කතා තවත් සොයාගෙන කියවන්න. ඒ ඇසුරෙන් පහත දැක්වෙන සටහන පුරවන්න.

| | කියවූ කතාවේ නම | ලබාගත් පණිවුඩය |
|---|---|---|
| i. | | |
| ii. | | |
| iii. | | |
| iv. | | |
| v. | | |